*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81

# ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

# A Historical Study on the Transcription of the Tripitaka and Manuscript Writing during the Anuradhapura Period

**Rubasinghe, A.S.[1] , Wimalasiri, B.G.S.P.[2] and Ranaweera, R.A.A.S.[3]**

**Abstract**

This historical study focuses on the "transcribing the Tripitaka" and the subsequent development of "manuscript writing" during the Anuradhapura period in Sri Lanka. Prior to its documentation, the Tripitaka was maintained through an oral tradition, passed down by Bhāṇaka monks. However, crises such as the 'Baminithiya famine' and foreign invasions posed serious threats to the continuation of this oral transmission. As a result, there emerged a pressing need to preserve the Dhamma in written form. The transition from oral to written tradition marked a significant turning point in the history of Buddhist literature in Sri Lanka. This study investigates how manuscript writing developed during the Anuradhapura period, a topic that has received limited scholarly attention. Therefore, the research aims to fill this gap by critically analyzing the methods of manuscript production in that era. Both primary and secondary sources were used in this study, applying historical analysis methods. The findings confirm that the process of writing began based on the existing oral tradition, and that transcribing the Tripitaka helped establish a more stable foundation for Buddhist literature in Sri Lanka. In conclusion, the transcription of the Tripitaka led to a significant shift in Sri Lanka's literary history, providing a strong base for the growth of written literature. Today's publishing systems, including the methods of writing, copying, and distributing texts, began with past practices.

**Keywords:** History, Anuradhapura period, Transcribing Tripitaka, Oral tradition, Manuscript Writing

---

[1] Senior Assistant Librarian, Library, University of Kelaniya, Sri Lanka.
Email: sajeewanie@kln.ac.lk, https://orcid.org/0000-0002-6291-2836

[2] Senior Assistant Librarian, Library, University of Kelaniya, Sri Lanka.
Email: sulekaw@kln.ac.lk, https://orcid.org/0000-0001-6489-5139

[3] Senior Assistant Librarian, Library, University of Kelaniya, Sri Lanka.
Email: achala@kln.ac.lk, https://orcid.org/0000-0002-7404-196X

Received: 31st December 2024, Accepted revised version: 28th May2025
This work is licensed under a Creative Commons Attribution-Share Alike 4.0 International License.

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81

**සංක්ෂේපය**

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක් මෙරට පැවති ත්‍රිපිටක සාහිත්‍යය මුඛභාෂිතව පවත්වාගෙන එන ලද්දකි. භාණක පරම්පරාගත ව පවත්වාගෙන එන ලද ත්‍රිපිටක සාහිත්‍යය, බැමිණිතියා සාගතය වැනි දුර්භික්ෂ සහ විදේශීය ආක්‍රමණ හේතුවෙන් එකල විද්වත් භික්ෂූන් වහන්සේලා හට මුඛපරම්පරාගත ව පවත්වාගෙන යාමේ නොහැකි තත්ත්වයන්ට මුහුණදීමට සිදුවූහ. එහෙයින් ධර්ම සාහිත්‍යයේ චිරස්ථිතිය උදෙසා ධර්මය ලේඛනගත කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟුණි. එම ලිඛිත සාහිත්‍යයේ ආරම්භය දෙස බැලීමේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සුවිශේෂී වූ බැවින් සහ ඒ ආශ්‍රිත ව ලේඛන සාහිත්‍යය වර්ධනය වූ ආකාරය විමර්ශනය කිරීම සඳහා වන මෙම අධ්‍යයනය අනුරාධපුර යුගය පදනම්කර ගනිමින් සිදු කරන ලදි. අනුරාධපුර යුගයේ ලේඛන සාහිත්‍යය බිහිවූයේ කෙසේ ද යන්න සහ ග්‍රන්ථකරණය සිදු වූ ආකාරය පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රවල තොරතුරු සඳහන් වුව ද ලේඛන සාහිත්‍යයේ ග්‍රන්ථකරණය පිළිබඳ ව සිදුව ඇති පර්යේෂණ අල්ප වූ බැවින් එම හිඩැස පිරවීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිණි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය සිදු වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය කිරීම යි. එහි දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා මුඛ භාෂිතයෙන් ත්‍රිපිටකය ආරක්ෂා කරගෙන ආ ආකාරය පිළිබඳව ද අධ්‍යයනය කිරීම සෙසු අරමුණු විය. මෙහි දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිත කළ අතර ඓතිහාසික මූලාශ්‍රය විශ්ලේෂණ ක්‍රමය උපයෝගී කරගන්නා ලදී. ඒ අනුව අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණයේ මූලාරම්භය මුඛභාෂිත ක්‍රමය පදනම් කරගනිමින් සිදු වී ඇති බවත්, එතෙක් පැවති මුඛභාෂිත ක්‍රමය සඳහා ස්ථිරසාර පදනමක් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් අනතුරුව ලංකාවේ ආරම්භ වී ඇති බවත් තොරතුරු ගවේශනයේ දී සනාථ විය. ත්‍රිපිටකය සහ අට්ඨකතා ඇතුළත් අතිවිශාල ධර්මස්කන්දයක් මෙසේ මුඛභාෂිතයෙන් ආරක්ෂාකර ගැනීම සඳහා මැනවින් සංවිධානය වූ ක්‍රමවේදයක් තිබිය යුතු ය. අතීතයේ පැවති මුඛභාෂිත ක්‍රමය තුළ පිළිවෙත රැකීම සහ විධිමත්භාවය හේතුවෙන් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට අවශ්‍යතාවය පැන නැගුණ වහාම එය ග්‍රන්ථාරූඪ කිරීමට හැකිවිය. බොහෝ විට මුල් කාලීන ග්‍රන්ථ රචකයෝ ධර්මධරයෝ වූහ. ඔවුන්ගේ අත්පිටපත් පිටපත්කරුවන් විසින් පිටපත්කරණය කර තිබේ. අනුරාධපුර යුගයේ දී ධර්ම සාහිත්‍යයට අමතරව වෙනත් සාහිත්‍ය කෘතීන් ගණනාවක් බිහි වී තිබූ බව මෙම අධ්‍යයනයේ දී තහවුරු විය. මේ සඳහා රජවරු මෙන් ම මහාමාත්‍යාදීන් අනුග්‍රහය දක්වා ඇත. මොවුන්ගේ කාර්යය වර්තමාන ප්‍රකාශයකයින්ගේ කාර්යයට සමාන කොට සැලකිය හැකි ය. වර්තමානයේ මෙන් ලිවීම, පිටපත්කරණය මෙන් ම බෙදාහැරීම යන ප්‍රකාශනයට අදාළ මූලික කාර්යයන් අතීත ග්‍රන්ථකරණය තුළ ද දැකිය හැකි බව සනාථ විය.

**මුඛ්‍ය පද:** ඉතිහාසය, අනුරාධපුර යුගය, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, මුඛභාෂිත ක්‍රමය, ග්‍රන්ථකරණය

**හැඳින්වීම**

ප්‍රකාශනය යනුවෙන් අදහස් කරන්නේ පත්‍රිකා, සඟරා, පුවත්පත් සහ පොත් ඇතුළත් මුද්‍රිත ද්‍රව්‍ය තෝරා ගැනීම, සැකසීම හා අලෙවි කිරීමයි (Encyclopedia of Britannica, 1998). මේ ක්‍රියාවලීන් තුළ

අතීතයේ ප්‍රකාශනය හා සම්බන්ධ මූලික කාර්යයන් වන ලේඛනය, පිටපත්කරණය මෙන්ම බෙදා හැරීම අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය විකාසය වී ඇති ආකාරය පිළිබඳ කරුණු පරීක්ෂා කිරීම සඳහා මූලාශ්‍රය ලෙස යොදා ගැනීමට ඉඩකඩ සැලසෙන්නේ පැරණි වංසකතා සහ පුරාවිද්‍යාත්මක සාධක ආශ්‍රයෙන් ය. වංසකතා සාහිත්‍යය ආශ්‍රයෙන් විජයාවතරණයේ සිට වර්තමානය දක්වා වන තොරතුරු ලිඛිත ස්වරූපයකින් ලබා ගැනීමට හැකියාව ලැබේ. ඊට පෙර පැවති ජනාවාස පිළිබඳ ව හෙළි කරගෙන ඇති මානව විද්‍යාත්මක තොරතුරුවලින් ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ කරුණු රැසක් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. එසේ වුව ද විජයාවතරණයට පෙර යුගයේ පැවති සාහිත්‍ය ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට එම මූලාශ්‍රයවලින් ලැබෙන පිටිවහල අල්පය.

වංසකතා සාහිත්‍යයට අනුව උතුරු ඉන්දියාවේ සිට පැමිණි විජය ඇතුළු පිරිස සැලකිය යුතු මට්ටමක සාක්ෂරතාවකින් හෙබි පිරිසක් ලෙස හඳුනාගත හැකි ය. විජය කුමරු සිංහබා රජුගේ උපරජු ලෙස අභිෂේක ලබා සිටියේ ය. (සිංහල මහාවංසය, 2003, 6:38). මෙම කාල පරිච්ඡේදයේ දී ඉන්දියාවේ රජවරු ශාස්ත්‍රොද්ග්‍රහණය රාජකීය ජීවිතයේ පූර්ව අවශ්‍යතාවක් ලෙස සලකා කටයුතු කළ බැවින් පාලනයට සම්බන්ධ වීමට පෙර රාජ්‍ය කුමාරවරුන් සාහිත්‍ය සහ විවිධ කලා ශිල්ප ප්‍රගුණ කරවීමට කටයුතුකර ඇති බව පැරණි භාරතීය සාහිත්‍ය කෘතිවලින් පැහැදිලි වේ. ඒ අනුව විජය කුමරු ද සැලකිය යුතු මට්ටමක සාක්ෂරතා මට්ටමක් ප්‍රගුණකර සිටියේ යැයි පිළිගැනීමට සිදු වේ. මෙම පිරිසේ සාක්ෂරතා මට්ටම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට තුඩුදෙන කරුණු කිහිපයක් වංසකතාවන්හි අන්තර්ගත වී තිබේ.

විජය රජු ක්ෂත්‍රිය මෙහෙසියක් නොමැතිව අභිෂේකයට අකැමැති වූ බැවින් මෙහෙසියක ගෙන්වා ගැනීම සඳහා යැවූ දූතයන් අත පඬුරු ද ලියුම් (හසුන්පත්) ද පඬි රජු වෙත යවන ලදී (සිංහල මහාවංසය, 2003, 7:51). පඬි රජු ද විජය රජු සඳහා කුමරියක් එවන අතර ලියමන්ද දී එව්වේය (සිංහල මහාවංසය, 2003, 7:57). මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ විජය රජු ශ්‍රී ලංකාවට පැමිණෙන විට පණිවුඩ හුවමාරු කරගැනීම සඳහා මෙරට හා භාරතය අතර අන්තර් සබඳතා පැවතිය හැකි පොදු අක්ෂර ක්‍රමයක් පැවති බවත්, භාෂා ව්‍යවහාරය හා ලේඛන කලාව ද දියුණුව පැවති බවත් ය. විජය රජුට පුතෙකු නොසිටි බැවින් ඔහුගේ ඇවෑමෙන් රජ කරවීම සඳහා තමන්ගේ මලණුවන් ශ්‍රී ලංකාවට එවන ලෙස ඉල්ලා විජය රජු තම පියාණන්ට හසුන්පත් යවා ඇත. අභය රජු පණ්ඩුකාභය කුමරුට “තෝ ගඟින් එතෙර අනුභව කර ඉන් මොබ නහ මක් එවයි කියා” හසුනක් යැවූ බව ද සඳහන් වේ. (සිංහල මහාවංසය, 2003, 10:48-49).

මහින්දාගමනයට පෙර කාල පරිච්ඡේදය තුළ හසුන් ගණුදෙනු කිරීමට හැකිවන පරිදි භාෂා ඥානය සහ ලේඛන කලාව ව්‍යවහාර ව පැවති බව හෙළිවන නමුදු මහින්දාගමනය රටේ භාෂා සාහිත්‍යය පිළිබඳ ව තීරණාත්මක අවස්ථාවක් ඇතිකිරීම සඳහා මංපෙත් සැලසුවේ ය. මිහිඳු මහ තෙරුන් වහන්සේ ලක්දිවට පැමිණියේ අතිවිශාල ගැඹුරු සාහිත්‍යයක් අන්තර්ගත ව පැවති ත්‍රිපිටකය සමග ය. අලිඛිතව පැවති නමුත් මෙම සාහිත්‍යය ලංකාවට ගෙන ඒමටත් ශ්‍රී ලංකාව තුළ එය ආරක්ෂාකර තැබීමටත් මිහිඳු මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු පිරිස උපස්ථම්භක වූහ. එහි ප්‍රතිඵලය වූයේ එක්වරම රට තුළට මනාලෙස

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
සංවිධානය වී තිබූ සාහිත්‍යයක් ප්‍රවිෂ්ට වීම යි. මිහිඳු මහරහතන් වහන්සේට දේවානම්පියතිස්ස රජු ඇතුළු සිංහලයනට අවබෝධකර ගැනීමට හැකිවන ආකාරයේ භාෂාවක් යොදා ගැනීමට හැකි විය. උන් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිංහල භාෂාව දැන සිටියේ යැයි සිතීමට තරම් සාධක කිසිවක් හමු නොවේ. එළඹිය හැකි වඩාත් සරල නිගමනය වන්නේ එම යුගයේ දී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැතිර තිබූ භාෂාව බොහෝ දුරට සමාන ස්වරූපයක් දරන්නට ඇතැයි යන්න යි.

**අරමුණු**

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය විකාසය වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම යි. මෙහිදී මෙරට පැවති මුඛභාෂිත ක්‍රමයේ සිට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා ග්‍රන්ථකරණය සිදු වූ ආකාරය පිළිබඳව ද අධ්‍යයනය කරනු ලැබී ය.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. එහිදී මූලික වශයෙන් ම උපයෝගී කරගනු ලැබුවේ ඓතිහාසික මූලාශ්‍රය වේ. ඒ අතුරින් ද මහාවංසය ඇතුළු වංසකතා සාහිත්‍ය බහුලව ම යොදා ගත් අතර අට්ඨකතා හා වෙනත් පැරණි සාහිත්‍ය මූලාශ්‍රයන් ද යොදා ගැනීමට සිදු විය. එහි දී ඓතිහාසික විශ්ලේෂණ ක්‍රමය භාවිත කරමින් අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය කෙසේ සිදු වී ද යන්නත් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම කෙසේ සිදු වීද යන්නත් තහවුරු කර ගැනීම පිණිස ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ දීර්ඝතම රාජධානි සමය වන අනුරාධපුරය යුගය ආගමික, සංස්කෘතික, දේශපාලන සහ සාමාජීය අංශවල අතිවිශාල පරිවර්තනයකට භාජනය වූ සශ්‍රීකමත් යුගයක් බැවින් අධ්‍යයනය සඳහා මෙම යුගය තෝරාගනු ලැබීය.

එක්රැස් කරගන්නා ලද ද්විතියීක දත්ත වෙනත් ද්විතියීක දත්ත හා සසඳමින් එහි නිවැරදිභාවය තහවුරු කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම පර්යේෂණයේ මූලික අරමුණු අනුව පෙළ ගස්වා ඇත.

**සාකච්ඡාව**

භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකය හා ඊට අදාළ අර්ථ විවරණ මුඛ පරම්පරාගත ව පවත්වාගෙන ආ ආචාර්ය පරම්පරා පිළිබඳ ව මහාවංශයේ සඳහන් වේ. "බුද්ධ පරිනිර්වාණයේ සිට ශාසන ඉතිහාසය ආචරියවාද සම්ප්‍රදාය මුඛ පරම්පරාගතව ආරක්ෂා කරගෙන ආ ඉතිහාස පරම්පරාවක අග්‍රඵලයයි" (ඉලංගසිංහ, 2003). ක්‍රි. පූ. 1 සියවසෙහි වළගම්බා රජ දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා ත්‍රිපිටක සාහිත්‍යය පවත්වාගෙන එනු ලැබුවේ මුඛ පරම්පරාගතව ය. පැරණි සාහිත්‍ය ඉතිහාසය තුළ පාළි ධර්මය හෙවත් පෙළ දහම (බුදුදහම) කටපාඩමින් පවත්වාගෙන ආ බවට සඳහන් වන වචනය වන්නේ "මුඛ පාළි" යන්නයි (නිකාය සංග්‍රහය, 1987; සොරත හිමි, 2013). මෙය වර්තමානයේ වනපොත්කරණය යනුවෙන්

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
හඳුන්වයි (සොරත හිමි, 1956 ; සොරත හිමි, 2013). එලෙස පවත්වාගෙන ආ සියල්ල ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු අනුක්‍රමයෙන් ලේඛනගත වන්නට විය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර පැවැති තත්ත්වය පිළිබඳව එනම් මුඛ පරම්පරාවෙන් පැවත ගෙන ආ සංවිධාන ව්‍යුහය පිළිබඳ ව නිශ්චිත තොරතුරු ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් සොයාගත හැකි ය. එනම්, ත්‍රිපිටක සාහිත්‍යය දිවයින පුරා ව්‍යාප්ත ව පැවති බව ද නොරහසකි. අදිකාරම්, (1963) දීඝ භාණක, මජ්ඣිම භාණක, සංයුත්ත භාණක, අංගුත්තර භාණක, ධම්මපද භාණක, උභතොවිභංග භාණක, මහාඅරියවංශ භාණක සහ මහා වත්තාළීසක භාණක වශයෙන් පැරණි ලක්දිව සිටි භාණකවරු පිළිබඳ දීර්ඝ ව සඳහන් කර තිබේ. බුද්ධඝෝෂ හිමියන් විසින් අටුවා රචනා කරන කාලය වන විට භාණක පරම්පරා 18ක් තිබූ බව ධම්මපදට්ඨකතාවේ සඳහන් වේ (සොරත හිමි, 2013). සූත්‍ර පිටකය හා විනය පිටකය පිළිබඳ භාණක පරම්පරා වාර්තා වන අතර විනයධර උපාලි තෙරුන්ගෙන් පැවත ආ බව ද සඳහන් ය. දිවයිනේ විවිධ ප්‍රදේශවල වැඩ සිටි භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටක ධර්මය දේශනා කළ බව අතීත සාහිත්‍ය මූලාශ්‍රය සාක්ෂි දරයි. ඉන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයේ ආරම්භය මුඛ පරම්පරාගත  කලාවක් ලෙස ස්ථාපිත ව තිබූ බව යි.

ග්‍රන්ථකරණයේ විකාශය සඳහා වැදගත් වූ ඊළඟ පියවර ලෙස සැලකිය හැක්කේ අනුරාධපුර යුගයේ දී ත්‍රිපිටකය සඳහා අටුවා බිහිවීම යි. භාණක පරම්පරා ආශ්‍රයෙන් හෙළ අටුවා සම්පාදනය වීම ද මෙරටට බුදුදහම ලැබී කෙටි කලකින් ම සිදුව ඇත. “මගධ බසින් වැටෙමින් ආ බුදු කැලි මග අටුවා හෙළ ඇඳුරෝ හෙළ බසින් තැබූහ” යනුවෙන් මගධ බසින්, පාලි භාෂාවෙන් වර්ධනය වෙමින් ආ බුද්ධකාලීන මහ අටුවා ලංකාවේ ධර්මධර, විනයධර හා මාතිකාධර ආචාර්යවරයන් විසින් හෙළ බසින් ලියා තබන ලදැයි ජයතිලක, (1932) සඳහන් වේ. පාලි අටුවාවල මහා අට්ඨකතා, මහාපච්චරී අට්ඨකතා සහ කුරුන්දි අට්ඨකතා ආදී වශයෙන් අට්ඨකතා රාශියක් පිළිබඳව සඳහන් ය (සන්නස්ගල, 1961). ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන අවස්ථාව වන විට ත්‍රිපිටකයට අමතරව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ අට්ඨකතා සාහිත්‍යයක් ද ශ්‍රී ලංකාවේ පැවතුණි. ඉන් පැහැදිලි වන කරුණක් වන්නේ මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ අටුවා කතා සාහිත්‍යයක් ශ්‍රී ලංකාවේ පැවති බව සහ මෙරට ප්‍රකාශන කලාව ඒ වන විට ඉතා ප්‍රබල තත්ත්වයක පැවති බව යි. භාණක පරම්පරාගත ක්‍රමය ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසුව ද භාවිත වූ බව ශිලාලිපිවලින් මෙන්ම පැරණි සාහිත්‍ය මූලාශ්‍රය මගින් ද තොරතුරු අනාවරණය වේ (අමරවංශ හිමි, 1969).

සිංහල ප්‍රකාශන කලාවේ ඉතා වැදගත් ම සන්ධිස්ථානය වන්නේ වළගම්බා රජ දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම යි. නිකාය සංග්‍රහයෙහි දැක්වෙන පරිදි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූයේ වළගම්බා රජු වල්වැදී සිටි කාලයේ දී පැවති සාගතයේ දීය (සමරනායක, 1960). ග්‍රන්ථාරූඪ කිරීම සඳහා භාවිත කරන ලද ද්‍රව්‍ය පිළිබඳ ව මහාවංශයෙහි දීර්ඝ විස්තරයක් සඳහන් නොවුව ද මෙම යුගයේ දී ත්‍රිපිටකය වැනි අතිමහත් සාහිත්‍යයක් ග්‍රන්ථවලට අන්තර්ගත කිරීමට තරම් ලේඛන කලාවක් ද ප්‍රකාශන කලාවක් ද ශ්‍රී ලංකාව තුළ බිහි වී තිබූ බව අවිවාදයෙන් පිළිගත යුතු ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන

කර්මාන්තයේ සන්ධිස්ථානයක් ලෙස පළමුවන සියවසේ දී එනම්, (ක්‍රි.පූ. 89-77) වළගම්බා රජ දවස ත්‍රිපිටකය සහ එහි අට්ඨකතා ග්‍රන්ථාරූඪ කිරීම දැක්විය හැකි ය.

"ත්‍රිපිටක පාළිය ද එහි ඒ අර්ථ කථාව ද මහා ප්‍රඥා ඇති පූර්වික භික්ෂූහු මුඛ ප්‍රඨයෙන් ගෙන ආවෝ ය. එකල් වැසි වූ භික්ෂූහු සත්ත්වයන්ගේ පරිහාණි දැක ධර්මයාගේ චිරස්ථිති පිණිස පොත්හි ලියවූහ" (සිංහල මහාවංසය, 2003, 33:102). මෙයින් පැහැදිලි වන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය සම්බන්ධයෙන් පැවති තත්ත්වයයි.

විජයාවතරණයේ සිට දෙවනපැතිස් රජ දවස මිහිඳු හිමියන් විසින් බුදුදහම ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් කාල පරිච්ඡේදය දක්වා වූ යුගයේ දී ශ්‍රී ලාංකිකයන්ගේ ඇදහිලි සහ විශ්වාසයන් බොහෝ දුරට උත්තර භාරතීය මතිමතාන්තර සහ සම්ප්‍රදායන් විසින් හැඩගසනු ලැබීයැයි නිශ්චය කිරීමට තරම් සාක්ෂි වංශකතා සාහිත්‍යය තුළ දක්නට ලැබේ. ඒ අතරම රටේ පැවති ගෝත්‍රික ඇදහිලි සහ විශ්වාසයන්ගෙන් ද ආභාසය ලබන්නට ඇතැයි සිතිය හැක. ශ්‍රී ලංකාව තුළ ග්‍රන්ථකරණයට ඉවහල්වන ආකාරයේ සාහිත්‍යයක් නිර්මාණය වූයේ මිහිඳු හිමියන්ගේ පැමිණීමත් සමඟ ය. උන්වහන්සේ සහ උන්වහන්සේ සමඟ පැමිණි භික්ෂූන්, හා උපාසක පිරිස විසින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය මෙරට විවිධ පිරිස් වෙත ගෙන ගියහ. ඒ අතරම ත්‍රිපිටකය උගත් සහ මුඛ පරම්පරාවෙන් ආරක්ෂාකර තැබීමට සමත් පිරිස් ද මිහිඳු හිමි විසින් බිහි කරන ලදහ (වජිර හිමි සහ නානායක්කාර, 1992).

වංසකතා සහ අට්ඨකතා සාහිත්‍යය තුළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර ස්මරණ ශක්තියෙන් ත්‍රිපිටකය ආරක්ෂා කරගෙන එම පිළිබඳව තොරතුරු සඳහන් වේ. ග්‍රන්ථකරණයට අදාළ ව කරුණු සඳහන්වන මුල් ම අවස්ථාව ලෙස ග්‍රන්ථධූර විදර්ශනාධූර වශයෙන් භික්ෂූන් වහන්සේලා කොටස් දෙකකට බෙදී ඇති බව සඳහන් වූ අවස්ථාව දැක්විය හැකි ය (සන්නස්ගල, 1961). ඉහතින් සඳහන් කළ පරිදි ස්මරණ ශක්තියෙන් ත්‍රිපිටකය ආරක්ෂා කරන ලද භික්ෂූන් පිළිබඳ ව කිසිවක් සඳහන් නොවන නමුදු ග්‍රන්ථධූරය යන්නෙන් එසේ ත්‍රිපිටකය ආරක්ෂා කළ භික්ෂූන් වහන්සේලා හැඳින්වූයේ ද යන්න විමර්ශනය කිරීම වැදගත් වේ.

සන්නස්ගල, (1961) ග්‍රන්ථධූර සහ විදර්ශනාධූරය නිර්වචනය කර ඇත්තේ පහත සඳහන් පරිදි ය. "ජාතික හා දේශික හැඟීම් මතු කිරීමට පෙරමුණ ගෙන ක්‍රියා කළ භික්ෂූන් ග්‍රන්ථ ධූරය පුරන්නන් හැටියට ද ශාසනික ප්‍රතිපත්ති රකිමින් භාවනානුයෝගීව සිටි භික්ෂූන් විදර්ශනාධූරය පුරන්නන් හැටියට ද හැඳින් විණි. ඉගෙනීමත් දහම් දෙසීමත් ග්‍රන්ථධූරය පිරූ භික්ෂූහු කළහ. ත්‍රිවිධ ශාසනයෙහි පර්යාප්තිය රක්කෝ ඔහු ය. ඔහු ධර්මකථික නමින් හැඳින්වූහ. ශාසනික පිළිවෙත් රකිමින් නිවන් අවබෝධකර ගැනීමට භාවනා කළෝ විදර්ශනාධූරය පිරුවෝ ය. ඔහු ත්‍රිවිධ ශාසනයෙහි ප්‍රතිපත්තියටත් ප්‍රතිවේධයටත් ළඳුන්නෝ ය. ඒ පිරිස හැඳින්වූයේ පාංශුකූලික භික්ෂූන් හැටියට ය."

පර්යාප්තිය රැකීම (ත්‍රිපිටකය ඉගෙනීම) ග්‍රන්ථධූරය පිරූ භික්ෂූන්ගේ කාර්යය වූ හෙයින් නොයෙක් දේ ඉගනීමට ද ධර්මකථික වූ නිසා දහම් දෙසීමේ දී ජාතික හා දේශීය හැඟීම මහජනයා තුළ ඇති කරවීමට ද ඔවුන්ට අවස්ථාව ලැබිණ (සන්නස්ගල, 1961).

සන්නස්ගලට අනුව ඉගෙනීමත් දහම් දෙසීමත් ග්‍රන්ථධූරය පිරූ භික්ෂූන් විසින් කළ බව සඳහන් වේ. ග්‍රන්ථධූර භික්ෂූන් පිළිබඳව මුල්වරට සඳහන් වන්නේ ලදතිස් රජුගේ කාල පරිච්ඡේදයේ දී ය. ග්‍රන්ථධූරය දැරූ භික්ෂූන් වහන්සේලා මුඛ පාඨයෙන් ත්‍රිපිටකය ආරක්ෂා කළ භික්ෂූන් වහන්සේම යැයි නිශ්චිත වශයෙන් ප්‍රකාශ කළ නොහැකි වන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසුව ද ග්‍රන්ථධූර භික්ෂූන් වහන්සේලා පිළිබඳව වංශ කතාවල තවදුරටත් සඳහන් ව තිබීම හේතුවෙනි. සමහරවිට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසුව ද ග්‍රන්ථධූර දැරූ භික්ෂූන් වහන්සේලා මහජනතාව වෙනුවෙන් ඉටු කළ සේවාවන් ඒ අයුරින්ම පවත්වාගෙන යාම නිසා ග්‍රන්ථධූර නාමය තවදුරටත් ඉතිරිව තිබුණා විය හැකි ය.

කෙසේ වුව ද අදිකාරම් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර මුඛ පාඨයෙන් එය පවත්වාගෙන ආ ආකාරය පිළිබඳව කිසියම් නිගමනයකට පැමිණීමට උත්සාහ දරා ඇත. ඔහුට අනුව ප්‍රථම ධර්ම සංගායනා අවස්ථාවේ සිට මුඛ පරම්පරාවෙන් ත්‍රිපිටකය පවත්වාගෙන යාම සඳහා වූ සංවිධාන ව්‍යූහයක් ඇතිකර ගන්නා ලදී. “එක් එක් ධර්ම කොට්ඨාසයක් එක් එක් භික්ෂු පිරිසකට භාර කිරීම උචිත යැයි එම සංගායනාවෙහි දී කල්පනා කරන ලදී. ලේඛන ද්‍රව්‍යවල දුර්ලභත්වයත් එහෙයින්ම ගුරු ගෝල පරම්පරා ක්‍රමයෙන් කට පාඩමින් ග්‍රන්ථ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවත් නිසා මෙලෙස වැඩ බෙදා ගැනීම වුවමනා වූ බැව් පෙනේ” (අදිකාරම්, 1963).

පළමු ධර්ම සංගායනා අවස්ථාවේ දී ම දීඝනිකාය ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද මජ්ඣිමනිකාය සාරිපුත්ත හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවට ද සංයුත්තනිකාය මහාකාශ්‍යප තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද අංගුත්තරනිකාය අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍යයින්ට ද පැවරුණි (සුමංගල විලාසිනී නාම දීඝනිකායට්ඨකතා, 1929; Paranavitana, 1970 ; සෙනෙවිරත්න, 2000). අදිකාරම් මහතා එම ක්‍රමය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා පැවති ආකාරය විස්තර කරන්නේ “මෙම ධර්ම කොට්ඨාසයන් භාණක භික්ෂූන් වහන්සේලා විසින් ද උන්වහන්සේලාගේ ශිෂ්‍ය පරම්පරාවන් විසින් ද ඉගෙන ගැනීමෙන් සහ කියැවීමෙන් බුදුන්ගේ ධර්මය ආරක්ෂා කරන ලදී යනුවෙනි” (අදිකාරම්, 1963).

### අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණය

ත්‍රිපිටකය මුඛ පරම්පරාවෙන් පවත්වා ගැනීම සඳහා විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැක. ඒ සඳහා එක් එක් භික්ෂූන් වහන්සේලාට ඒ ඒ කොටස් වනපොත් කිරීමට සලස්වා ශිෂ්‍යානුපරම්පරාවෙන් එය පවත්වා ගෙන ආ බවත් අට්ඨකතාවල එන තොරතුරු ආශ්‍රයෙන් හෙළිවේ. අට්ඨකථාවලට අනුව ත්‍රිපිටකය එසේ ආරක්ෂා කරගෙන පවත්වාගෙන එනු ලැබුවේ භාණකයන්

වහන්සේලා විසිනි. ත්‍රිපිටකයේ එක් එක් කොටස් ධාරණය කර ආරක්ෂා කිරීම එක් එක් භින්ෂුවට භාර වී තිබුණි . (ගුණරත්න, 1987 ; රණසිංහ, 2006 ).

ඉහතින් සඳහන් කරන ලද පරිදි එක් එක් භික්ෂු පරම්පරාවට ත්‍රිපිටකයේ ඒ ඒ කොටස් පවත්වාගෙන යාමේ ක්‍රමය මහාභාරතයේ දී පැවැත් වූ ප්‍රථම ධර්ම සංගායනාවේ දී ආරම්භ විය. මෙම ක්‍රමය මිහිඳු මා හිමියන් විසින් ශ්‍රී ලංකාවේ බුද්ධාගම ස්ථාපිත කිරීමෙන් පසු බිහි වූ භික්ෂු පරම්පරාව ආශ්‍රිතව ද ඇති කරන ලදැයි සිතිය හැකි ය. මහාභාරතයේ පැවති මුඛ පරම්පරාගත ක්‍රමය ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා අතර ද ඇති කිරීමේ දී ඒ සඳහා ආරම්භයේ දී කිසියම් ක්‍රමයක් පවතින්නට ඇත. එහෙත් මිහිඳු හිමියන් විසින් ශ්‍රී ලංකාවේ භික්ෂු පරම්පරාවක් ආරම්භ කිරීම මගින් බුදුදහම පවත්වාගෙන යාමට කටයුතු යෙදූ බව සඳහන් වීම හැර ඒ ආකාරයට මුඛ පරම්පරාගතව ත්‍රිපිටකය පවත්වාගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම පිළිබඳව ඓතිහාසික ලේඛනවල කිසිවක් සඳහන් නොවේ.

මුඛ පරම්පරාවෙන් ධර්මය ආරක්ෂා කරගෙන පැමිණි භික්ෂු පරපුර භාණක වශයෙන් හඳුන්වන ලදී. අටුවා ග්‍රන්ථවලින් හෙළිවන පරිදි ත්‍රිපිටකයේ ඒ ඒ නිකායන් හැදෑරූ සහ ඒවා කටපාඩමින් දැන සිටි භික්‍ෂූන් වහන්සේලා භාණකයන් ලෙස හැඳින්වූහ. භාණක පරම්පරාව පිළිබඳ පරණවිතාන මහතා මෙසේ සඳහන් කර ඇත.

“සියලුම ආගමික කථා මුඛ පරම්පරාවෙන් පැවත ආවේ ය. ත්‍රිපිටකයෙන් කොටසක් වනපොත් කළ භික්ෂූන් වහන්සේ නමක් තම ශිෂ්‍යයාට ඒ කොටස වන පොත් කරගෙන කියවිය හැකි තෙක් කියා දුන්නාහ. ත්‍රිපිටකයේ කිසියම් කොටසක් වනපොත් කළ භික්ෂුව එයින් හැකි පමණක් දිනපතා සජ්ඣායනා කළ විට එම ශිෂ්‍යයෝ ද එසේම කළහ. ත්‍රිපිටකයේ එම කොටස වනපොත් කළ භික්ෂූහු කිහිප දෙනෙක් සිටියහ. ත්‍රිපිටකයේ වැදගත් කොටසක් ආරක්ෂා කරගැනීමට එකම භික්ෂුවක් කෙරේ බලාපොරොත්තු ඇති කරගැනීම සාහිත්‍ය කෘතියක එකම පිටපතක් ලියා තිබීම වැනි ය”.

කෙසේ වුව ද භාණක නමින් හැඳින්වූයේ ත්‍රිපිටකයේ ඒ ඒ කොටස් දැනසිටි භික්ෂූන් වහන්සේලා සියලු දෙනාම සඳහා ද යන්න පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමට අට්ඨකථාවලින් හෙළිවන තොරතුරු ප්‍රමාණවත් නොවේ. භාණක යන වචනය බොහෝ දුරට යොදාගෙන ඇත්තේ ත්‍රිපිටකයේ ඒ ඒ නිකාය ආශ්‍රිත ව බව පෙනී යයි. දීඝ, මජ්ඣිම, සංයුත්ත සහ අංගුත්තර නිකායවල භාණකයන් වහන්සේලා පිළිබඳ ව අටුවා කථාවල බොහෝ තැන්හි කරුණු සඳහන් වී තිබේ. දීඝ භාණක අභය නම් භික්ෂූන් වහන්සේ කැලණියේ විසූ බව ද වසභ රජු, දීඝ භාණක භික්ෂූන් වහන්සේලා විසින් සූත්‍ර දේශනා කරනු අසා සිටි බව ද අට්ඨ කතාවල සඳහන් වී ඇත (අදිකාරම්, 1963).

මජ්ඣිම භාණකයන් පිළිබඳ ව පපඤ්චසූදනී ටීකාවෙහි මනෝරථපූරණීයෙහි සඳහන් වන අතර (අදිකාරම්, 1963). සංයුත්ත භාණකයන් පිළිබඳ බුද්ධවංශ අට්ඨ කථාවෙහි ද සඳහන් වේ. අංගුත්තර භාණක හිමිවරුන් පිළිබඳව විශුද්ධි මාර්ගයෙහි ද මනෝරථපූරණීයෙහි ද සඳහන් වන අතර ජාතක භාණක හිමිවරුන් පිළිබඳව ද එම කෘතියෙහි ම සහ සම්මෝහවිනෝදනියේ ද සඳහන් වේ (අදිකාරම්,

1963). මේ අතර අටුවා කථාවල සඳහන් තවත් වැදගත් භාණක ගණයක් වන්නේ ධම්මපද භාණක හිමිවරුන් බව සඳහන් කළ හැකි ය. උන්වහන්සේලා පිළිබඳ ව බුද්දක පාඨ අට්ඨකතාවෙහි සඳහන් වේ (අදිකාරම්, 1963).

සියලුම නිකාය සඳහා එම නිකාය නමින් හැඳින්වූ භාණක කණ්ඩායම් දක්නට ලැබුණ ද බුද්දක නිකාය සඳහා වූ භාණක ගණයක් පිළිබඳව සඳහන් නොවේ. එසේ වුව ද මිලින්ද ප්‍රශ්නය කෘතියෙහි බුද්දක භාණක හිමිවරුන් පිළිබඳව සඳහන් වේ (අදිකාරම්, 1963). ඒ තුළින් පැහැදිලි වන්නේ සියලු ම නිකාය ග්‍රන්ථ මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ යතිවර පරම්පරාවක් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර වැඩ සිටි බවයි.

නිකාය ග්‍රන්ථ ආශ්‍රිත ව මේ ආකාරයට භාණක ක්‍රමයක් පැවති බව අට්ඨකථා ආශ්‍රයෙන් හෙළිවන නමුදු මේ පිළිබඳ ව ගැටළු සහගත තත්ත්වයක් ඇති වන්නේ ත්‍රිපිටකයේ ඒ ඒ පිටක ආශ්‍රයෙන් ද එවැනි බෙදීමක් සමහර අවස්ථාවල දී දක්නට ලැබෙන බැවිණි. අදිකාරම් (1963) ඒ පිළිබඳව සඳහන් කරන්නේ සුත්ත, විනය සහ අභිධම්ම යන කොටස් තුනට බෙදා ඇති ක්‍රමය ගත් කල්හි ඒ අනුව පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කරගෙන ආ තැනැත්තන් භාණක නමින් හඳුන්වා නැති බවයි. සුත්තංතිකා, විනයධරා සහ අභිධම්මිකා වශයෙන් එම තැනැත්තන් හඳුන්වාදුන් බව සඳහන් කරයි (අදිකාරම්, 1963). තවදුරටත් ඒ පිළිබඳව ඔහු ප්‍රකාශ කරන්නේ අටුවා ඉගෙන ගෙන කියවූ අය අට්ඨකතිකා නම් වූ බවත් පිටකත්‍රය පිළිබඳ ප්‍රවීණතාවක් දැරූ අය ත්‍රිපිටකා නම් වූ බවත් නිකායත්‍රය පිළිබඳ ප්‍රවීණත්වයක් දැරූ අය චතුනිකායිකා නම් වූ බවත් ය (අදිකාරම්, 1963).

කෙසේ වුව ද මෙම මතය භාණක පරම්පරා පිළිබඳ මතය සමඟ සැසඳීමේ දී කිසියම් ආකාරයක අවුල් සහගත තත්ත්වයක් මතු කිරීමට හේතුවන බව පෙනේ. සූත්‍ර, විනය, සහ අභිධම්ම, පිටක වෙන වෙනම දැන සිටියේ ද ත්‍රිපිටකය සම්පූර්ණයෙන් ම දැන සිටියේ දැයි සඳහන් වන මෙම ප්‍රකාශය ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ ක්‍රමයට අදාළ වන්නේ දැයි විමසිය යුතුව ඇත. පළමුවන ධර්ම සංගායනාවට අදාළ තොරතුරුවලින් හෙළි වන්නේ ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම සඳහා වූ ක්‍රමයක් එම අවස්ථාවේ සිට බිහි වූ බව යි. ඒ අනුව සූත්‍ර පිටකය සහ විනය පිටකය කටපාඩමින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා එක් එක් භික්ෂු පරම්පරාවකට පවරනු ලැබූහ (ගුණානන්ද හිමි, 2016). ඊට වෙනස්ව යන ආකාරයකට ත්‍රිපිටකයේ එක් එක් පිටකය ආශ්‍රිත ව ඒවා වනපොත් කළ භික්ෂු පරම්පරාවක් ඇති වූයේ යැයි සිතිය නොහැක.

ත්‍රිපිටකයේ ඒ ඒ පිටක දැන උගත් භික්ෂූන් වහන්සේලා පරපුරක් සිටියේ යැයි ද ඊට අමතරව ඒ ඒ පිටකයේ එක් එක් කොටස් වෙන වෙනම ආරක්ෂා කළ භික්ෂු පරපුරක් සිටියේ යැයි ද යන අදහස පිළිගන්නේ නම් ත්‍රිපිටකය ආරක්ෂා කරගෙන පැමිණි ආකාරය පිළිබඳව ව්‍යාකූලසහගත තත්ත්වයක් ඇති වේ. වඩාත් නිශ්චිත සහ පැහැදිලි ස්වරූපයක් දරන්නේ භාණක භික්ෂූන් වහන්සේලා විසින් ත්‍රිපිටකයේ එක් එක් කොටස් ආරක්ෂා කරගෙන පැමිණියේ ය යන්න යි. ඊට අමතර ව ත්‍රිපිටකය පිළිබඳ

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
ඒ ඒ භික්ෂූන් වහන්සේලාගේ දැනුම් මට්ටම අනුව සුත්තංතිකා, විනයධරා, අභිධම්මිකා, ත්‍රිපිටකා, චතුනිකායිකා වශයෙන් භික්ෂූන් වහන්සේලා හැඳින්වූවා විය හැකි ය. ත්‍රිපිටකය ආරක්ෂා කිරීමේ වගකීම පැවරුණ භාණක භික්ෂූන් වහන්සේලා සහ ත්‍රිපිටකය පිළිබඳ දැනුම අනුව හුදු භාවිතයක් වන්නට ඇතැයි යන්න සහ පසුව සඳහන් වන යෙදුම් අතර සම්බන්ධයක් ගොඩ නැඟීම එතරම් යෝග්‍ය නොවනු ඇත. කෙසේ වුවද මේ පිළිබඳ පර්යේෂණ කිරීම මගින් වඩාත් නිවැරදි නිගමනයකට එළඹීමට හැකියාව ලැබෙනු ඇත.

නිකාය සංග්‍රහයේ මුඛ පරම්පරාවෙන් ත්‍රිපිටකය ආරක්ෂා කරගෙන පැමිණි භික්ෂූන් වහන්සේලාගේ නාමාවලියක් ඉදිරිපත්කර තිබේ. එහි මුලින්ම උපාලි, දාසක, සෝනක, සිත්ගව සහ මොග්ගලීපුත්ත තිස්ස යන භික්ෂූන් වහන්සේලාගේ නම් සඳහන්ව තිබේ (ගුණරත්න, 1987). මෙම භික්ෂූන් වහන්සේලා පළමුවන සහ දෙවන ධර්ම සංගායනා අවස්ථාවන්හි දී බුදුදහම මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම සඳහා නායකත්වය ලබාදුන් පිරිස ලෙස සැලකිය හැකි ය. ඉන්පසු සඳහන් වන්නේ මහින්ද, ඉත්තිය, උත්තිය, සම්බල, බද්දසාල, සුමන සාමනේර, අරිට්ඨ යන නම් ය. එම භික්ෂූන් වහනසේලා මහින්ද හිමි සහ උන් වහන්සේ සමඟ වැඩි ශ්‍රාවක පිරිස ය. ඉන් පසු භික්ෂූන් වහන්සේලා විසිහතරදෙනෙකුගේ නම් සඳහන්වන අතර එය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා මුඛ පරම්පරාවෙන් ත්‍රිපිටකය පවත්වාගෙන ආ භික්ෂූන් වහන්සේලාගේ පරම්පරාවේ නායකත්වය ගත් භික්ෂූන් වහන්සේලා ලෙස සැලකිය හැකි ය.

නිකාය සංග්‍රහයේ එන මෙම විස්තරය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පැණ නැගේ. පළමුවැන්න වන්නේ මෙම නාමාවලිය ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු ගත වූ අවුරුදු ගණනකට පසුව මේ ආකාරයට ලේඛනගත කිරීම සඳහා ලැබුණේ කෙසේ ද යන්න යි. එහෙත් ඒ පිළිබඳව විස්තරාත්මක ව තොරතුරු ලබා ගැනීමට හැකියාවක් නැත. දෙවන කරුණ වන්නේ මෙම භික්ෂූන් වහන්සේලා කවර කාර්යභාරයක් ඉටු කරනු ලැබුවේ ද යන්න හෝ උන්වහන්සේලා අතුරින් සමකාලීනයන් සිටියේ ද යන්න හෝ අවබෝධකර ගැනීමට නොහැකි වීම යි. උදාහරණයක් ලෙස මිහිඳු හිමිගේ නමේ සිට අරිට්ඨ දක්වා වූ පිරිස සමකාලීනයෝ වෙති. එහෙත් ඉන් පසු පිරිස අතරින් සමකාලීන වූ පිරිස් සිටියේ ද යන්න අවබෝධකර ගැනීමට නොහැකි ය. තුන්වන කරුණ වන්නේ මේ ආකාරයට නාමාවලියක් ඉදිරිපත් කරනු ලැබුව ද මෙහි මීට පෙර ඉදිරිපත් කරන ලද විමර්ශනවල සඳහන් වූ ආකාරයේ කිසිදු විශේෂ නාමයක් මෙම භික්ෂූන් වහන්සේලාගේ නම් ඉදිරියෙන් සඳහන් නොවීම යි. ග්‍රන්ථධූර, විදර්ශනාධූර, ත්‍රිපිටකධර, විනයධර යන කිසිදු විශේෂණයක් උන්වහන්සේලාගේ නම්වලට ඉදිරියෙන් යොදා නැත. එබැවින් එම ධූර උන්වහන්සේලා හඳුන්වා දීමේ දී වැදගත් නොවූයේ ද යන ප්‍රශ්නය පැන නගී. කෙසේ වුවද මෙම ලේඛනය තුළින් පැහැදිලි වන මූලික කරුණ වන්නේ ත්‍රිපිටකය මුඛ පරම්පරාගත ව අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා ඉතා විධිමත් පිළිවෙතක් භික්ෂූන් වහන්සේලා විසින් එය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා කාල පරිච්ඡේදය තුළ පවත්වාගෙන ආ බව යි.

එමෙන් ම විදේශයෙන් පැමිණි ෆාහියන් හිමියන් ගේ දේශාටන වාර්තාවෙහි ද දඹදිව සිට පැමිණි භික්ෂු නමක් මුඛ භාෂිතයෙන් ධර්ම දේශනා කළ බවක් සඳහන් වේ. එනම්, ෆාහියන් එම දේශනාව පිටපත්

කර ගැනීමට අදහස් කළ විට එම ධර්ම කථික භික්ෂූනම මෙසේ පැවසී ය. ඒ දේශනාවේ ලේඛනාරූඪ කළ වාර්තාවක් නැත. එය මම මුඛ වචනයෙන් පමණක් ප්‍රකාශ කරන්නෙමි (විමලබුද්ධි හිමි, 1958). මෙයින් ද පැහැදිලි වන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර මුඛ භාෂිත ක්‍රමය ලංකාව තුළ ස්ථාපිතව තිබූ බව යි.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර පැවති ක්‍රමය පිළිබඳව ඉහත සඳහන් විමර්ශනවලින් පැහැදිලි වන්නේ ග්‍රන්ථ ප්‍රකාශන ක්‍රමය බිහි වීමට පෙර වාචික ප්‍රකාශන ක්‍රමයක් මැනවින් ස්ථාපිතව ශ්‍රී ලංකාවේ පැවතියේ ය යන්න යි. ඊට සියවස් ගණනාවකට පෙර දේශනා කරන ලද බුදුදහම මුළුමනින් ම ප්‍රකාශිත ස්වරූපයකින් විධිමත් පිළිවෙළකට ගොනුකර තිබුණි. ඕනෑම මොහොතක එය ලේඛනගත කිරීමට තරම් සංවිධිත විය. ඒවා දැන සිටි පුද්ගලයන්ගේ ප්‍රමාණය විශාල වුව ද ඒවා අතර විෂමතා පැවතියේ කලාතුරකිනි. ප්‍රකාශන කලාවක් නොපැවතිය ද ඕනෑම අවස්ථාවක දී ප්‍රකාශන කර්මාන්තයක් ඇරඹීමට තරම් ශක්තිමත් වූ ත්‍රිපිටක සාහිත්‍යයක් ශ්‍රී ලංකාවේ පැවතුණි.

### අනුරාධපුර යුගයේ ග්‍රන්ථකරණයේ ආරම්භය

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය ආරම්භ වූයේ ක්‍රි. පූ. පළමුවන (89-77) සියවසයේ වළගම්බා රජ දවස ය. ත්‍රිපිටකය දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තරනිකාය, සංයුත්තනිකාය, ඛුද්දකනිකාය යන නිකාය පහෙන් සමන්විත අති විශාල අන්තර්ගතයක් සහිත සාහිත්‍යයකි. එම සෑම නිකායකට ම අර්ථ කතා ද ඒ වනවිට සකස් වී තිබුණි. මෙම සියල්ල ග්‍රන්ථාරූඪ කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයේ ආරම්භය අති විශාල කාර්යයක් ලෙසත් මහා ප්‍රයත්නයක් ලෙසත් ආරම්භ වූ බව පෙන්වා දිය හැකි ය. සෑම සූත්‍රයක් ම ග්‍රන්ථාරූඪ කර ඇත්තේ වාර්තාගත කිරීමක ස්වරූපයෙනි. එම සූත්‍ර දේශනා කළ කාල පරිච්ඡේද, දේශනා කළ ස්ථානය, දේශනා කළ පුද්ගලයා සහ නිමිත්ත වර්තාවක ස්වරූපයෙන් ලේඛන ගතකර තිබේ. කෙසේ වුව ද සමහර සූත්‍රවල පූර්ව වාර්තාකරණය කෙටි ස්වරූපයක් ගන්නා අතර ම සමහර සූත්‍රවල දීර්ඝ ස්වරූපයක් උසුලයි. තවත් සමහර සූත්‍රවල බුද්ධ දේශනාව පිළිබඳ ව ඊට අදාළ සිදු වීම් පෙළගස්වා ඇති වාර්තාකරණයක් සූත්‍රය අවසානය දක්වා ම සටහන්වන අවස්ථා ද දැකිය හැකි ය. උදාහරණයක් ලෙස රතන සූත්‍රය සැලකීමේ දී මුලින් ම සඳහන් වන්නේ එම දේශනය විශාලා මහනුවර තුන්බිය දුරු කිරීම අරඹයා දේශනා කරන ලද බවකි.

එහෙත් දීඝනිකායේ සීලක්ඛන්ධ වර්ගයේ එන බ්‍රහ්මජාල සූත්‍රයෙහි පූර්ව වාර්තාකරණය තරමක් විස්තරාත්මක වේ. එහි I" II, III" සහ IV යන කොටස් තුළ බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කිරීමට පසුබිම් වූ කරුණු විස්තර වී ඇත. දීඝනිකායේ සෝණදණ්ඩ සූත්‍රයෙහි අවසානය දක්වා ම බුදුරජාණන් වහන්සේගේ දේශනයට අමතරව සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට අදාළ තොරතුරු සඳහන් වේ. මේ ආකාරයට ඒ ඒ අවස්ථාවට අදාළ වන පරිදි සිද්ධි වාර්තා සූත්‍රවල ඇතුළත් වී තිබේ.

මෙම කරුණ ග්‍රන්ථකරණය සම්බන්ධයෙන් වැදගත් වන්නේ එතෙක් පැවති මුඛ භාෂිතයේ ස්වරූපය හඳුනා ගැනීමට ය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලේඛනගත

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
කිරීමේ අරමුණෙනි. එහි දී බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද කරුණු ද ඊට අමතර ව ඒවා මුඛ භාෂිතයෙන් පවත්වාගෙන ඒමේ දී ඊට අදාළ ව ඇතුළත් කරන ලද වාර්තාවන් ද පවතී. මේ සියල්ල ග්‍රන්ථාරූඪ කිරීම තුළින් ඉතා විශ්ලේෂණාත්මක අයුරින් ඒවා ග්‍රන්ථාරූඪ කිරීමට අවස්ථාව සැලසුනි.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යය මහාවංස කතුවරයාගේ විශේෂ අවධානයට ලක් වූ බවක් නොපෙනේ. මෙම සිදුවීම විස්තර කිරීම සඳහා කතුවරයා විසින් යොදාගෙන ඇත්තේ ගාථා දෙකක් පමණි.

**පිටකත්තය පාළිඤ්ච, තස්සා අට්ඨ කථාපිච**

**මුඛපාඨෙන ආනෙසුං, පුබ්බේ භික්ඛූ මහාමති**

**හානිං දිස්වාන සත්තානං, තදා භික්ඛූ සමාගතා**

**චිරට්ඨිතත්ථං ධම්මස්ස පොත්තකෙසු ලිඛාපයුං**

“ත්‍රිපිටක පාළිය ද එහි ඒ අර්ථ කථාව ද මහා ප්‍රඥා ඇති පූර්වික භික්ෂූහු මුඛ ප්‍රථයෙන් ගෙන ආවෝ ය. එකල්හි වැසිවූ භික්ෂූහු සත්ත්වයන්ගේ පරිහාණි දැක ධර්මයාගේ චිරස්ථිති පිණිස පොත්හි ලියවූහ.” මහාවංස කතුවරයා මෙම විස්තරය පාඨ කිහිපයකට පමණක් සීමා කිරීමට හේතු වී ඇත්තේ ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීම නිසා වන්නට ඇත. මෙකල පැවති අභයගිරි මහාවිහාර භේදය නිසා සමහර විට වළගම්බා රජු මේ සඳහා ආධාර ලබා නොදුන්නා විය හැකි ය. කෙසේ වුව ද මහාවංස කතුවරයා ඉහතින් සඳහන් කළ දේට වැඩියමක් ප්‍රකාශ නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය පිළිබඳ මෙම ඓතිහාසික සිදුවීමට අදාළ බොහෝ විස්තර දැන ගැනීමට තිබූ අවස්ථාව ගිලිහී ගොස් ඇත.

කෙසේ වුව ද පසු කාලීන ව ලියා ඇති නිකාය සංග්‍රහය සහ රාජරත්නාකරයෙහි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට අදාළ සමහරක් තොරතුරු ඇතුළත් වී තිබේ. නිකාය සංග්‍රහයේ එය සඳහන් වන්නේ “මේ මහාස්ථවිර පරම්පරාවෙන් මුඛ පාළි වශයෙන් පැවත ආවාවූ ත්‍රිපිටක ධර්මය එක්තරා ජනපදාධියක්හුගේ ආරක්ෂාවෙන් පන්සියයක් රහතන් වහන්සේ මාතුළ නම් දනව්වෙහි අළුලෙන වැඩහිඳ පොත් සංගායනා කොට ලියෑ වූ සේක” යනුවෙනි (ගුණරත්න, 1987). රාජරත්නාකරයෙහි “මේ සතිස් මහා ස්ථවර පරම්පරාවෙන් මුඛ පාළි වශයෙන් පැවත ආවාවූ ත්‍රිපිටක පාළි ධර්මය රහතන් වහන්සේ එන දස නුවණ මද භික්ෂූහු විසින් සිත්හලා දරාගත නොහැකී සිතා වළගම්බා නම් මහරජාණන් කාලයෙහි එක්තරා ජනාධිපතියක්හුගේ ආරාක්ෂාවෙන් පන්සියයක් රතන් වහන්සේ මාතුල නම් දනව්වෙහි අලුලෙන වැඩහිඳ පොත් සංගායනා කොට ලියවූ සේක” යනුවෙන් සඳහන් වේ (රූපසිංහ, 1995). කෙසේ වුව ද මෙම ග්‍රන්ථ දෙකෙහි ම ජනපද නායකයාගේ ආධාරය පිළිබඳ ව සඳහන් වන නමුදු රජුගේ කිසිදු සම්බන්ධයක් පිළිබඳව සඳහන් නොවේ. කෙසේ වුව ද සද්ධර්මසංග්‍රහයෙහි භික්ෂූන් වහන්සේලා විසින් රජුට ඒ සඳහා ශාලාවක් සහ කොළ ලබා දෙන ලෙස දැන් වූ බව සඳහන් කර තිබේ. රජුගේ කිසියම් හෝ සක්‍රීය සහභාගීත්වයක් හෝ ආධාරයක් පිළිබඳව සඳහන් වන එකම තැන සද්ධර්මසංග්‍රහයේ මෙම අවස්ථාව පමණි.

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96
DOI: https://doi.org/10.4038/sllr.v39i2.81
අල්විස් (1972) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට රජු විසින් අණ කළ බව සඳහන්කර ඇත. එසේ වුවද ඉහතින් දැක්වූ කරුණු හැරෙන්නට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සම්බන්ධයෙන් වළගම්බා රජුගෙන් ලැබුණු සහායක් පිළිබඳව පැරණි මූලාශ්‍රය කිසිවක සඳහන් නොවන බව ප්‍රකාශ කළ හැකි ය. එබැවින් අල්විස් මහතාගේ ප්‍රකාශය මූලාශ්‍රයවලින් සනාථ වන්නක් නොවන බව ප්‍රකාශ කිරීමට සිදු වේ.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා යොදාගත් ග්‍රන්ථවල ස්වරූපය, ලියූ ආකාරය, ලියූ පුද්ගලයන් ආදිය පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමට තරම් තෙරාතුරු මහාවංශයෙහි සඳහන් නොවේ. ග්‍රන්ථ ලිවීම සඳහා දැනට ඓතිහාසික සාක්ෂිවලින් හෙළිවන්නේ තල්පත් යොදා ගත්තේ ය යන්න ය. එසේ වුව ද ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා පුස්කොළ පොත් යොදා ගැනීමට එකවරම හැකියාව ලැබුණේ කෙසේද? තල්පත් සකස් කිරීම සහ ලිවීම ආදිය පිළිබඳව ශිල්පීය දැනුම එකවරම ලබා ගත්තේ යැයි සිතිය නොහැක. එසේ නම් ඉන් අදහස් වන්නේ එම ශිල්පීය ක්‍රම ඒ වනවිටත් පැවතියේ ය යන්න යි. එසේ නම් ඊට පෙරද ග්‍රන්ථකරණය ආරම්භ වී තිබීමට ඉඩ ඇත.

කෙසේ වුව ද ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා කුමන ද්‍රව්‍යයක් යොදා ගත්තේ ද යන්න පිළිබඳ ව නිශ්චිත ව සාක්ෂි මහාවංශයෙහි සඳහන් නොමැති වීම කණගාටුවට කරුණකි. භික්ෂූන් වහන්සේලා විසින් ඒ සඳහා ශාලාවක් සකස් කරන ලෙස ද කොළ (*leaves*) ලබා දෙන ලෙස ද රජුගෙන් ඉල්ලා සිටි බව පමණක් සඳහන් වේ (ධම්මකිත්ති හිමි, 2011). එහෙත් එම කොළ කවරක් ද යන්න හඳුනා ගැනීමට තරම් තෙරතුරු නොමැත. එසේම ග්‍රන්ථාරූඪ කිරීමේ දී එක් පිටපතක් පමණක් සකස් කරන ලද්දේ ද එසේ නැත්නම් පිටපත් කිහිපයක් සකස් කරන ලද්දේ ද යන්න පිළිබඳව ද නිශ්චිත තොරතුරු ලබාගත නොහැකි වේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ දී ඒ සඳහා රන්පත් භාවිත කළ බවට දැක්වෙන මතයක් සමහර විද්වතුන් විසින් දක්වා තිබේ. ඊට හේතු වී ඇත්තේ අදිකාරම් ශ්‍රී ලංකාවේ පැතිර පවත්නා ජනප්‍රවාදයන් පිළිබඳව කරුණු දක්වා තිබීම යි. එම ජනප්‍රවාදයට අනුව ත්‍රිපිටකය රන්පත්වල ලියා අලු විහාරයේ ගලක නිදන්කර ඇත. මෙම ජනප්‍රවාදයේ එන කරුණු අදිකාරම් මහතා සම්පූර්ණයෙන් පිළිගෙන නැති නමුත් ඇතැම් විට මෙහි කිසියම් සත්‍යතාවක් තිබිය හැකි බව ප්‍රකාශකර ඇත. ත්‍රිපිටකය රන්පත්වල ලියන්නට ඇතැයි යන කරුණු සාකච්ඡා කිරීම සඳහා බොහෝ අය ආධාර කරගෙන ඇත්තේ අදිකාරම් මහතා විසින් සඳහන්කර ඇති මෙම ජනප්‍රවාදයේ එන තොරතුරු ය.

මෙකල ග්‍රන්ථකරණ කටයුතු සඳහා තල්පත්වලට අමතරව රන්පත් සහ තඹ (*copper*) පත් ද භාවිතකර තිබේ. ක්‍රි. ව. 127 සිට ක්‍රි. ව. 171 දක්වා කාල පරිච්ඡේදය තුළ රජ කළ වසභ රජුගේ කාල පරිච්ඡේදය තුළ සකස් කරන ලද රන්පතක් ද නව වන සියවසට අයත් රන්පතින් සැකසූ පොතක් ද ප්‍රඥා පාරමිතා නම් වූ මහායාන සූත්‍රයේ ලියැවූ රන් පත් පොතක් ද සොයා ගෙන තිබේ (Karunaratne, 2006). එබැවින් මින් කුමන හෝ ද්‍රව්‍යයක් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට යොදා ගැනීමට ඉඩ තිබිණ. එසේ වුව ද ත්‍රිපිටකය හා අට්ඨකතා ග්‍රන්ථාරූඪ කර තිබීමට අදාළ පසුකාලීන තොරතුරුවලින් පැහැදිලි වන්නේ බොහෝ විට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා ද පුස්කොළ පොත් භාවිත කිරීමට ඉඩ පැවතියේ ය.

වළගම්බා රජ වැටකේපතක ලියා මහසඟරුවනට පූජා කළ බව මහාවංශයෙහි සඳහන් වේ. ඉක්බිති පහන් සිත් ඇති රජ තෙමේ වැටකේ පත ලියා ඒ විහාරයට සංඝ භෝග දුන්නේය (සිංහල මහාවංසය, 2003, 33:50-51). කෙසේ වුව ද වැටකේ පත යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න පැහැදිලි නොමැති බැවින් ග්‍රන්ථකරණය සඳහා යොදා ගත් කොළ පිළිබඳ ව වටහා ගැනීමට නොහැකි වේ. දුටුගැමුණු රජ දවස එම රජු විසින් කරන ලද පුණ්‍ය කර්මවල විස්තර පිං පොත නැමැති ග්‍රන්ථයෙහි සඳහන්ව තිබූ බව ය (සිංහල මහාවංසය, 2003, 32:23-26). එසේම පිං පොත ලිවීම සඳහා පුද්ගලයකු සිටි බව ද එහි සඳහන් වේ. ඉන් අදහස් වන්නේ ලිවීම පුරුදු පුහුණු කළ හෝ වෘත්තියක් වශයෙන් පවත්වාගෙන ගිය අය දුටුගැමුණු රජ යුගයේ සිටි බව යි.

### අනුරාධපුර යුගයේ සිංහල අටුවා පාලියට නැඟීම

මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමෙන් පසු ත්‍රිපිටකය සඳහා අටුවා කතා ලිවීම ආරම්භ විය. එම අටුවා ලිවීම සඳහා භාවිත කරන ලද්දේ සිංහල භාෂාව යි. ඉතා ඈත යුගයේ දී පවා අටුවා වැනි ගැඹුරු කෘති සඳහා සිංහල භාෂාව යොදා ගැනීමට හැකියාව ලැබී තිබුණි. ත්‍රිපිටකය මගධ භාෂාවෙන් පැවති නමුත් ඒවා ද සිංහලට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කළ අවස්ථා ද පැවතුණි. එබැවින් ත්‍රිපිටකයේ සමහර ග්‍රන්ථ සිංහල භාෂාවෙන් ලියැවී තිබුණි. ක්‍රි. ව. 398 සිට 428 දක්වා රජ කළ බුද්ධදාස රජුගේ සමයේදී මහාධර්ම කතී භික්ෂුව විසින් සූත්‍ර ධර්මයක් සිංහලයට පරිවර්තනය කරන ලදී (සිංහල මහාවංසය, 2003, 37:175). එසේම මෙම රජු විසින් භාවිත කරන ලද වෛද්‍ය ග්‍රන්ථයක් පිළිබඳව ද තොරතුරු හෙළි කරයි (සිංහල මහාවංසය, 2003, 37:146-148). මෙම තත්ත්වය තුළ පැහැදිලි වන දෙයක් වන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය බුද්ධදාස රජ යුගය වනවිට සැලකිය යුතු මට්ටමින් දියුණුව පැවති බව යි. මෙම කාලය වනවිට ග්‍රන්ථාරූඪ කළ ත්‍රිපිටකය පැවතුණි. ඒ සඳහා සිංහලෙන් සකස් කරන ලද අටුවා පැවතුණි. ත්‍රිපිටකයේ සමහර කොටස් සිංහලට පෙරලා ග්‍රන්ථ වශයෙන් ප්‍රකාශකර තිබුණි. ඒ අතරම වෙද පොත් ආදිය ද භාවිතයේ පැවතුණි.

සිංහල අටුවා කතා පාලියට පෙරළීම ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයේ තවත් වැදගත් අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. ඊට අදාළ ව මහාවංසයේ සඳහන්වන විස්තරය එම අවදියේ ලංකාවේ ග්‍රන්ථකරණය පිළිබඳව කරුණු රැසක් හෙළිදරවු කරයි. බුද්ධඝෝෂ හිමි ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ අටුවා කතා පාලියට නැඟීමේ අභිප්‍රායෙනි. උන්වහන්සේ ඒ වනවිට ශ්‍රී ලංකාවේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪකර ඇති බව දැනගෙන සිටියේ ය. බුද්ධඝෝෂ හිමියන්ට පරිවර්තනය සඳහා ත්‍රිපිටක ග්‍රන්ථ භාර දීමට පෙර ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා උන්වහන්සේගේ ධර්මය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට තීරණය කර තිබුණි. ඒ සඳහා ගාථා තුනක් උන්වහන්සේට ලබා දී ඒවා විමර්ශනය කරන ලෙස ඉල්ලා සිටින ලදී. බුද්ධඝෝෂ හිමියන් පිළිතුරු වශයෙන් විශුද්ධි මාර්ගය රචනා කර ඉදිරිපත් කරන ලදී (සිංහල මහාවංසය, 2003, 37:233-237). මෙම අවස්ථාවේදී විශුද්ධි මාර්ගයේ පිටපත් 03 ක් පිළිබඳව ද, ඒවා සුලු වශයෙන් හෝ වෙනස් වී නොතිබීම පිළිබඳව ද කරුණු සඳහන් වේ (සිංහල මහාවංසය, 2003, 37:238-243). ඉන්

Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96
DOI: https://doi.org/10.4038/sllr.v39i2.81
පැහැදිලි වන එක් කරුණක් වන්නේ මේ වනවිට ග්‍රන්ථකරණය දියුණු මට්ටමකට පත්ව තිබූ බවත් වැඩි පිටපත් ප්‍රමාණයක් ප්‍රකාශනයට පත් කරන අයුරින් එය සකස් වී තිබූ බවත් ය.

බුද්ධඝෝෂ හිමියන්ගේ ලංකා ගමනේ සහ අටුවා කතා සිංහලයට නැඟීම පිළිබඳ තොරතුරු සහ ඓතිහාසික වාර්තා විශ්ලේෂණය කරන විට පැහැදිලි වන්නේ ඒ වනවිට ද ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය ඉතා දියුණු මට්ටමින් ක්‍රියාත්මක ව පැවතියේ ය යන්න යි.

බුද්ධඝෝෂ හිමියන් අට්ඨකතා පාලියට නැඟීම සඳහා සිංහල අටුවා කථා පහක් උපයෝගී කර ගත් බව මහාචාර්ය සන්නස්ගල මහතාගේ අදහස යි. සන්නස්ගලට (1961) අනුව අට්ඨකථා පහ වන්නේ මහාඅට්ඨ කතා, මහාපච්චරියට්ඨ කතා, කුරුන්දියට්ඨ කතා, අන්ධකට්ඨ කතා හා සංඛෙපට්ඨ කතා යන අටුවා කතා වේ. එසේ වුව ද සමන්තපාසාදිකාවේ සඳහන් වන්නේ බුද්ධඝෝෂ හිමියන් අටුවා කතා තුනක් එනම් මහාට්ඨ කතා, මහාපච්චරියට්ඨ කතා හා කුරුන්දියට්ඨ කතා යන අටුවා තුන පරිවර්තනය කළ බව යි. මේ පිළිබඳ ව අදහස් දක්වන සන්නස්ගල (1961) ප්‍රකාශ කරන්නේ අන්ධක සහ සංඛෙප අට්ඨ කතා දෙක හෙළ සිංහල අටුවා නොවන බව යි. ඔහුට අනුව අන්ධක අට්ඨ කතාව අන්ධක රටෙහි කරන ලද්දක් වන අතර සංඛෙප අටුවා කතාව පිළිබඳ එවැනි හෝ විස්තරයක් ලබා ගත නොහැකි බව ප්‍රකාශ කරයි. සන්නස්ගල මහතා අන්ධක සහ සංඛෙප අට්ඨ කතා සම්බන්ධව දක්වන මෙම අදහස තහවුරු කෙරෙන වෙනත් කිසිදු සාධකයක් සොයා ගත නොහැකි වේ. එබැවින් මෙම අට්ඨ කතා දෙකේ සැබෑ ස්වරූපය කුමක් ද යන්න හෝ සැබවින් ම මේවා සිංහල අටුවා කතා නොවූයේ ද යන්න පිළිබඳව හෝ නිගමනයකට එළඹිය නොහැකි වේ.

බුද්ධඝෝෂ හිමියන් පාළි බසට නැඟීම සඳහා භාවිත කරන ලද සමන්තපාසාදිකාවේ සඳහන් සිංහල අටුවා කතා තුන දැනට සොයාගැනීමට නොහැකි වී ඇත. එහෙත් එවැනි අටුවා කතා තුනක් පැවති බව හා ඒවා පසුකාලීන ග්‍රන්ථකරණයේ දී ආධාර කරගත් බව පොළොන්නරු යුගය ආශ්‍රිත සාහිත්‍ය ග්‍රන්ථවලින් හඳුනාගැනීමට හැකි වී තිබේ. මහාට්ඨ කතාව පිළිබඳ ධම්පියා අටුවා ගැටපදයෙහි 136-143 සහ 149 පිටුවල සඳහන් වන අතර මහාපච්චරියට්ඨකතා සහ කුරුන්දි අට්ඨකතා පිළිබඳ ව පාළි සාහිත්‍යයේ 138 වැනි පිටුවේ සඳහන් වේ (බුද්ධදත්ත හිමි, 1956). කෙසේ වුව ද බුද්ධඝෝෂ හිමියන් සිංහල අටුවා පාළියට පෙරලන අවස්ථාවේදී මීට අමතරව අටුවා කථා රාශියක් පැවති බව පැහැදිලි වේ. සීහලට්ඨකතා මහාවංසය, ථූපවංස වණ්ණනා, අනාගතවංස වණ්ණනා, විමුක්තිමාර්ගය නමස්කාරවණ්ණනා වැනි අට්ඨකතා (සන්නස්ගල, 1961) ශ්‍රී ලංකාවේ මෙම කාල පරිච්ඡේදය තුළ භාවිත වී තිබේ.

බුද්ධඝෝෂ හිමියන් විසින් අට්ඨකතා පාළියට නැඟීමත් උන්වහන්සේ විසින් විශුද්ධි මාර්ගය වැනි කෘති රචනා කිරීමත් තුළින් මේ රටේ පාළි අට්ඨකතා ආශ්‍රිත අති විශාල ග්‍රන්ථකරණයක් ආරම්භ වූ බව පෙනේ. බුද්ධඝෝෂ හිමියන්ට අමතරව බුද්ධදත්ත, ධම්මපාල, උපසේන, මහානාම වැනි භික්ෂූන් වහන්සේලා ද පාලි අට්ඨකතා රචනයට පෙළඹුණි. මෙම භික්ෂූන් වහන්සේලා පස් නම විසින් රචනා කරන අට්ඨකතා පිළිබඳව චන්ද්‍රරතන හිමි සහ ගුණානන්ද හිමි සඳහන් කර ඇත.

**සමන්තපාසාදිකා විනයට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ අට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**සුමංගලවිලාසිනී දීඝනිකායට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**පපඤ්චසූදනී මජ්ඣිමනිකායට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**සාරත්ථප්පකාසිනී සංයුත්තනිකායට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**පරමත්ථජොතිකා බුද්දඛපාඨට්ඨ කථාව (බුද්ධඝෝෂ හිමි)**

**ධම්මපදට්ඨකථා (බුද්ධඝෝෂ හිමි)**

**පරමත්ථදීපනී උදානට්ඨකථාව (ධම්මපාල හිමි)**

**පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨකථා (ධම්මපාල හිමි)**

**පරමත්ථජෝතිකා සුත්තනිපාතට්ඨකථා (බුද්ධඝෝෂ හිමි)**

**පරමත්තදීපනී පේතවත්ථු අට්ඨකථා (ධම්මපාල හිමි)**

**පරමත්ථදීපනී විමානවත්ථු අට්ඨකථා (ධම්මපාල හිමි)**

**පරමත්ථදීපනී ථෙර ථේරී ගාථට්ඨකථා (ධම්මපාල හිමි)**

**ජාතකට්ඨකථා (කර්තෘ අවිනිශ්චිතයි)**

**සද්ධම්මප්පජෝතිකා නිද්දේසට්ඨකථා (උපසේන හිමි)**

**සද්ධම්මප්පකාසිනී පටිසම්භිදාමග්ගට්ඨකථා (මහානාම හිමි)**

**විසුද්ධජන විලාසිනී අපදානට්ඨකථා (කර්තෘ අවිනිශ්චිතයි)**

**මධුරත්ථවිලාසිනී බුද්ධවංසට්ඨකථා (බුද්ධදත්ත හිමි)**

**පරමත්ථදීපනී චරියාපිටකට්ඨකථා (ධම්මපාල හිමි)**

**නෙත්තිප්‍රකරණට්ඨකථා (ධම්මපාල හිමි)**

**අත්ථසාලිනී නම් ධම්මසංගනී අට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**සම්මෝහවිනෝදනී විභංගට්ඨකථාව (බුද්ධඝෝෂ හිමි)**

**පරමත්ථදීපනී නම් පඤ්චප්ප්‍රකරණ අට්ඨකථාව (කර්තෘ අවිනිශ්චිතයි)**

(චන්දරතන හිමි, 1968 ; ගුණානන්ද හිමි, 2016)

අටුවාචාර්ය ධම්මපාල හිමි කෘතහස්ත විශාරදයෙකු බවත් බුද්ධඝෝෂ හිමියන්ට නොදෙවෙනි දැනුමක් උන්වහන්සේට තිබූ බවත් අටුවා ග්‍රන්ථවලින් බොහෝමයක් ධම්මපාල හිමියන් විසින් ලියා අවසන් කර තිබූ බවත් චන්දරතන හිමි, (1968), ගුණානන්ද හිමි, (2016) විස්තර කර ඇත. බුද්ධඝෝෂ හිමියන්ට ලිවීමට ඉතිරිව තිබුණේ බුද්දකනිකායේ ග්‍රන්ථ කිහිපයක් බවත් ධම්මපාල හිමි පරමත්ථදීපනී උදානට්ඨකථාව, පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨ කථාව, පරමත්ථදීපනී පේතවත්ථු අට්ඨකථාව, පරමත්ථදීපනී විමානවත්ථු අට්ඨකථාව, පරමත්ථදීපනී ථෙරථේරී ගාථාට්ඨකථාව, පරමත්ථදීපනී චරියාපිටකට්ඨකථාව, නෙත්තිප්පකරණට්ඨකථාව යන පාලි අටුවා ග්‍රන්ථ රචනා කළහ (චන්දරතන හිමි, 1968).

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
ශ්‍රී ලංකාවේ පැවති ග්‍රන්ථකරණය පිළිබඳ විස්තර ස්වදේශීය මූලාශ්‍රයවලින් පමණක් නොව විදේශීය මූලාශය තුළින් ද තහවුරු වී තිබේ. ඉන්දියාවේ සංචාරයෙහි යෙදුණු හියුං සියැං නැවත චීනයට යනවිට මහායාන ධර්ම පුස්තක 124 ක් ද අන්‍ය ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ 520 ක් ද සිය රටට ගෙන ගියේය (හියුං සියැං, 1952).

හියුං සියැං භ්‍රමණවෘත්තාන්තය මඟින් මෙකල ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයට යොදාගත් තල්කොළ පිළිබඳව විස්තරයක් පිටු අංක 392 හි මෙසේ සඳහන් වේ. නගරයෙන් උතුරු දෙසැ ලී 30 ක් පමණ වටැති තාල වනයක් වේ. ඉතා දිග පළලැති මේ ගස්වල කොල දිලිසෙති. ඉන්දියාව මුලුල්ලේ ම ලිවීමට ගනු ලබන්නේ මෙම කොළය. ඉන් අදහස් වන්නේ ඒ කාලය වනවිට ග්‍රන්ථකරණය සඳහා තල් කොළ භාවිතය ඉතා ඉහල මට්ටමකට පත්ව තිබුණේ ය යන්න යි.

හියුං සියැං භ්‍රමණවෘත්තාන්තය තුළින් පැහැදිලි වන මූලික කරුණ වන්නේ බුදුදහමට අදාළ ව ප්‍රබල ප්‍රකාශන කර්මාන්තයක් බුදුදහම ව්‍යාප්ත වී පැවැති රටවල විශේෂයෙන් ම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ආශ්‍රිත රටවල පැවතියේ ය යන්න යි. මෙම රටවල් වලින් උන්වහන්සේට ග්‍රන්ථ 644 ක් තමන්ගේ රටට ගෙන යාමට හැකි වේ. මොනම හේතුවක් නිසා හෝ එම ග්‍රන්ථවල එක පිටපතක් පමණක් පැවතියේ නම් ඒවා තම රටට රැගෙන යාමට අවස්ථාවක් නොලැබේ. එසේ වුවද එම අවස්ථාව ලබා ගැනීම තුළින් පැහැදිලි වන්නේ ග්‍රන්ථකරණය සැලකිය යුතු මට්ටමකින් ව්‍යාප්ත වී තිබූ බවත් හියුං සියැං වැනි විදේශීය භික්ෂූන් වහන්සේ නමකට පවා ඒවා රැගෙන යාමට තරම් එම පොත් සුලභව පැවතියේ හෝ පහසුවෙන් පිටපත්කර ගැනීමට පහසුකම් සලසා තිබුණේ ය යන්න යි.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය පිළිබඳ ඓතිහාසික සාධක ඔස්සේ තොරතුරු හෙළිවන තවත් අවස්ථාවක් වන්නේ චීන ජාතික ෆාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාවෙන් හෙළිවන තොරතුරු ය. ෆාහියන් හිමියන්ගේ සංචාරය ආරම්භ වන්නේ ක්‍රි.ව. 399 දී ය. ක්‍රි. ව. 414 දී උන්වහන්සේ නැවත චීනයට ළඟා වූ අතර ක්‍රි. ව. 416 දී උන්වහන්සේගේ දේශාටන වාර්තාව ප්‍රකාශයට පත් විය (විමලබුද්ධි හිමි, 1958). උන්වහන්සේ අවුරුදු 15ක කාලය තුළ ආසියාවේ බෞද්ධ රාජධානී 30ක සංචාරය කළ අතර ඉන් අවුරුදු දෙකක් ගත කරන ලද්දේ ලංකාවේ ය.

ෆාහියන් හිමියන් ශ්‍රී ලංකාවේ දී බෞද්ධ ග්‍රන්ථ ලබා ගත් ආකාරය උන්වහන්සේගේ දේශාටන වාර්තාවේ මෙසේ සඳහන්කර ඇත. ''ෆාහියන් මේ රටේ (සිංහල දේශයේ) අවුරුදු දෙකක් නැවතී සිටියේ ය. එහි දී හෙතෙම මහීශාසක විනය පිටකයේ පිටපතක් ලබා ගත්තේ ය. දීර්ඝාගම, සංයුත්තාගම, සංයුත්ත සංචය පිටක (සන්නිපාත) යන ග්‍රන්ථ ද ඔහුට ලබා ගත හැකි විය'' (විමලබුද්ධි හිමි, 1958). මෙම ග්‍රන්ථ ලේඛනය පරීක්ෂා කරනවිට පැහැදිලි වන්නේ උන්වහන්සේට ථෙරවාද බුදුදහම ආශ්‍රිත කෘති පමණක් නොව මහායාන ග්‍රන්ථවල පිටපත් ද ශ්‍රී ලංකාවෙන් ලබාගත හැකි වූ බව යි. කෙසේ වුව ද පැහැදිලි වන මූලික කරුණ වන්නේ ෆාහියන් හිමි චීනයට රැගෙන ගිය කෘති අතර ථෙරවාද කෘති මෙන් ම මහායාන කෘති ද පැවති බව යි.

භික්ෂූන් වහන්සේලා දේශනා කළ සියලු ම කරුණු එකල ග්‍රන්ථාරූඪ ව පැවතියේ නැත. උන්වහන්සේලා බුද්ධ ධර්මය පැහැදිලි කරදෙන අතර ම ඒවා විස්තර කිරීමට ද කටයුතු කළහ. දඹදිවින් පැමිණි භික්ෂූන් නමක් පැවැත් වූ ධර්ම දේශනයක් පිළිබඳ වාර්තාවක් ෆාහියන්ගේ දේශාටන සටහන්වලට එකතු කර තිබේ. එම භික්ෂූන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය පිළිබඳව කෙටි සටහනක් තම වාර්තාවට ඇතුළත්කර ඇති ෆාහියන් හිමියන් අවසානයේ දී මෙසේ සඳහන් කරයි. ඒ අවස්ථාවේ දී ෆාහියන් ඒ දේශනාව පිටපත් කර ගැනීමට අදහස් කළේ ය. එවිට ඒ භික්ෂුව මෙසේ පැවසීය. ඒ දේශනාවේ ලේඛනාරූඪ කළ වාර්තාවක් නැත. එය මම මුඛ වචනයෙන් පමණක් ප්‍රකාශ කරන්නෙමි, (විමලබුද්ධි හිමි, 1958). මින් පැහැදිලි වන්නේ ධර්ම දේශනා වශයෙන් කරනු ලබන ප්‍රකාශන ග්‍රන්ථාරූඪව පැවතියේය යන අදහසක් මෙකල විද්වතුන් අතර තිබීමත් එයින් පිටස්තරව ධර්ම දේශනා කිරීම අසාමාන්‍ය තත්ත්වයක පැවති බවත් ය.

ෆාහියන් වැනි භික්ෂූන් ශ්‍රී ලංකාවට පැමිණියේ ද එවැනි ධර්ම ග්‍රන්ථ ශ්‍රී ලංකාවෙන් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. ථෙරවාද බුදුදහම ප්‍රචාරය වී තිබූ සහ ඇදහූ රාජ්‍යයන් ගණනාවකින් ග්‍රන්ථ ලබා ගැනීම සඳහා ඉතා සුදුසු දේශයක් ලෙස පිළිගෙන තිබුණේ ශ්‍රී ලංකාව යි. බුදු සමය පැතිර ගිය කලාපය අති විශාල ය. එසේ වුව ද එම රටවලින් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණියේ නිර්මල බුදුදහම පිළිබඳ කෘති ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් වී තිබේ ය යන්න ඒ වනවිට බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම වී තිබූ බැවිනි. ඉන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය රටේ සංස්කෘතික ප්‍රබෝධයේ මූලික අවදියේදී ම කලාපීය වශයෙන් විශාල පිළිගැනීමකට ලක්වන ආකාරයෙන් සැකසී තිබුණේ ය යන්න යි.

**නිගමන සහ යෝජනා**

අනුරාධපුර යුගය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය සම්බන්ධයෙන් වැදගත්වන සිදුවීම් කිහිපයකට ඉඩ ප්‍රස්ථා සලසා දුන්නේ ය. මිහිඳු හිමියන්ගේ ආගමනය මේ රටේ ලේඛනගත නොවූ ප්‍රකාශන කර්මාන්තයක් සඳහා මඟ පෑදුවේ ය. ලොව කිසිම රටක වාර්තා වී නැති ආකාරයේ මුඛ භාෂිත නොහොත් අලිඛිත ප්‍රකාශනයක් ශ්‍රී ලංකාව තුළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ ක්‍රි. පූ. 89-77 වර්ෂය දක්වා පවත්වාගෙන යෑම ඉතා විශේෂ සිද්ධියක් ලෙස හැඳින්විය හැකි ය.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය අඩංගු ත්‍රිපිටකය, ඒවා ග්‍රන්ථාරූඪ කිරීමේ අවස්ථාව දක්වා ම මුඛපරම්පරාගත ව පවත්වාගෙන යනු ලැබී ය. අතිවිශාල ධර්මය ඒ අයුරින් මුඛපරම්පරාවෙන් පවත්වාගෙන ඒම සඳහා ඉතා විධිමත් සහ මැනවින් සංවිධානය වූ ක්‍රමවේදයක් පැවති බව නිගමනය කළ හැකි ය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම තුළින් ඉතා පැහැදිලි ලෙස සනාථ වූයේ මුඛපරම්පරාගත ක්‍රමය එම අවස්ථාව වනතුරු ම, විධිමත්භාවය සහ පිළිවෙත රැකගෙන සිටි බව යි. ග්‍රන්ථාරූඪ කිරීමට අවශ්‍යතාව පැන නැගුණ වහාම ඒවා ග්‍රන්ථාරූඪ කිරීම තුළින් පැහැදිලි වන්නේ ලේඛනගත නොවූවත් ඒවා ග්‍රන්ථවල ස්වභාවයෙන් පවත්වාගෙන පැවති බව ය. ලොව පවත්නා එකම අලිඛිත ග්‍රන්ථකරණය ලෙස හැඳින්විය හැක්කේ මෙසේ ත්‍රිපිටකය සහ අට්ඨකතා මුඛපරම්පරාගත ව පවත්වාගෙන ඒම යි.

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 77-96*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81
ත්‍රිපිටකය මුඛපරම්පරාවෙන් පවත්වාගෙන ආ ක්‍රමය පිළිබඳව සවිස්තර තොරතුරු දැන ගැනීමට පැරණි මූලාශ්‍රයවලින් වැඩි ඉඩකඩක් නොලැබීම ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ ව වැඩිදුර කරුණු අධ්‍යයනය කිරීමේ දී බාධාවක් ව පැවතිණි. එම ක්‍රමය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබාගත හැකි වූයේ නම් මුඛ පරම්පරාගත අලිඛිත ප්‍රකාශනය පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස වළගම්බා රජ දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයේ ආරම්භය සනිටුහන් කළ හෙයින් ත්‍රිපිටකය සහ එහි අට්ඨකතා සියල්ල ඉතා කෙටි කලක් තුළදී ග්‍රන්ථාරූඪ කරනු ලැබී ය. ත්‍රිපිටකයේ අන්තර්ගත සියලු ම කාරණා පිළිබඳ ව සලකා බැලීමේදී ද අට්ඨකතා ප්‍රමාණය පිළිබඳ ව සලකා බැලීමේ දී ද නිගමනය කළ හැක්කේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ ක්‍රියාවලිය තුළින් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණ ක්‍රියාවලියේ ආරම්භය මහාපරිමාන මට්ටමකින් ආරම්භ වූයේ ය යන්නයි. ඒ අනුව එකවරම අතිවිශාල කෘති ප්‍රමාණයක් ග්‍රන්ථාරූඪ කරනු ලැබී ය. ඒ තුළින් සියවස් ගණනාවක් අඛණ්ඩව වර්ධනය වූ ග්‍රන්ථකරණය සඳහා මුල පුරනු ලැබීය.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ සමහර කරුණු අඥාත වන අතර ඒ තුළින් ඉහතින් දැක්වූ ආකාරයට ආරම්භ වූ ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තයේ මූලාරම්භය පිළිබඳ ව සමහර කරුණු දැන ගැනීමට අවස්ථාවක් නොලැබේ. වංසකතාවල මෙම පුවත විස්තර කර ඇත්තේ ඉතා කෙටියෙන් වන අතර තරමක් හෝ තොරතුරු දැනගනීමට ඉඩ ලැබෙන්නේ නිකාය සංග්‍රහය සහ රාජරත්නාකරය යන පසු කාලීන මූලාශ්‍රයවලිනි.

මෙම අඥාත ස්වරූපය නිසා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කවර ද්‍රව්‍ය උපයෝගී කරගනිමින් ද යන ඉතා වැදගත් කරුණ අනාවරණය කර ගැනීමට අවස්ථාවක් නොලැබුණි. ඒ අතරම ඒ හා සම්බන්ධ අනාවරණය වන අනික් කරුණ වන්නේ පැරණි මූලාශ්‍රය තුළ සඳහන් නොවුණ ද කිසියම් ආකාරයක ලිඛිත ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයක් ඊට පෙර පැවතීමට ඉඩ තිබුණේ ය යන්න යි. එක්වරම අතිවිශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කිරීමට තරම් ලේඛන කලාවක් ඒ සඳහා යොදාගන්නා ද්‍රව්‍යවල භාවිතයත් සහ ලේඛනාරූඪ කිරීම සඳහා පුහුණු පිරිසක් සිටියේ ය යන්න තුළින් ගම්‍ය වන්නේ ඊට පෙර සිට ම කිසියම් ආකාරයක ග්‍රන්ථකරණයක් ශ්‍රී ලංකාවේ පැවතියේ ය යන නිගමනය යි.

බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨකතා පාලියට නැඟීමේ ක්‍රියාවලිය තුළත් ෆාහියන් සහ හියුං සියැං දේශාටන වාර්තා තුළත් බුද්ධදාස රජුගේ වෛද්‍ය ග්‍රන්ථ රචනය වැනි ග්‍රන්ථ තුළත් ගම්‍යවන ප්‍රධාන කරුණ වන්නේ අනුරාධපුර යුගය තුළ දී ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය එහි අවසන් යුගය වනවිට ඉතා විශිෂ්ට, ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ප්‍රකාශන කර්මාන්තයක තත්ත්වයට පත්ව තිබූ බව ය.

*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.81

**විමර්ශන මූලාශ්‍ර**


බුද්ධඝෝස හිමි. (1925). සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකතා. සෝමාවතී හේවාවිතාරණ භාරකාර මණ්ඩලය.

අදිකාරම්, ඊ. ඩබ්. (1963). **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය**. ජේ. ජී. ජයවර්ධන සහ සමාගම

අමරවංශ හිමි, කේ. (1969). **ලක්දිව සෙල්ලිපි**. ගොඩගේ.

ඉලංගසිංහ, එම්. (2003). **මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය**. කර්තෘ.

ගුණරත්න, එල්. (සංස්.). (1987). **නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය**. රත්න පොත්

ගුණානන්ද හිමි, ජී. (සම්.), (2016). **ත්‍රිපිටක අට්ඨකතා සාහිත්‍ය විමර්ශනය**. ගොඩගේ.

චන්ද්‍රරතන හිමි, එල්. (1968). **පාලි අට්ඨකතා සාහිත්‍යය**. සමයවර්ධන.

ජයතිලක, ඩී. බී. (සංස්.), (1932). **ධම්පියා අටුවා ගැටපදය.** ලංකාභිනව විස්තෘත යන්ත්‍රාලය.

ධම්මකිත්ති හිමි, පි. (2011). **සද්ධර්ම සංග්‍රහය**. ශ්‍රී ලංකා සංස්කෘතික පදනම

බුද්ධදත්ත හිමි, පි. (1956). **පාළි සාහිත්‍ය.** ස්වභාෂා ප්‍රකාශකයෝ.

රණසිංහ, ආර්. එච්. අයි. එස්, (2006). **පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය** : ක්‍රිස්තු පූර්ව 6 වන සියවසයේ සිට ක්‍රිස්තු වර්ෂ 13 වන සියවස දක්වා, කර්තෘ ප්‍රකාශන

රූපසිංහ, කේ. (සංස්.). (1995). **රාජරත්නාකරය.** ගොඩගේ.

වජිර හිමි, කේ. සහ නානායක්කාර, එස්. (සංස්.). (1992). 2300 වසරක මිහිඳු සංස්කෘතිය. බුද්ධ ශාසන අමාත්‍යාංශය.

විමලබුද්ධි හිමි, බී. (අනුවා.). (1958). බෞද්ධ රාජධානී පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව. ගුණසේන.

සන්නස්ගල, පී. (1961). **සිංහල සාහිත්‍ය වංශය.** ගොඩගේ.

සමරනායක, ඩී. පී. ආර්. (සංස්.). (1960). **නිකාය සංග්‍රහය**, ගුණසේන.

**සිංහල මහාවංසය** (2003). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

සෙනෙවිරත්න, ඒ. (2000). ***අලුවිහාර ත්‍රිපිටක ධර්ම සංගායනාවේ ඓතිහාසික පසුබිම හා ඉන් ඇති වූ ශාසනික ප්‍රබෝධය.* *තුළ.*** *සම්භාවනා*, වෙ. 1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය

සොරත හිමි, වි. (2013). වනපොත්කරණය හා භාණක සම්ප්‍රදායෝ. තුළ. *ප්‍රවචන*. 4(1). භික්ෂු විශ්වවිද්‍යාලය.

සොරත හිමි, වි. (1958). **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.** අනුල යන්ත්‍රාලය.

හියුං සියැං, (1961). බුද්ධදත්ත හිමි, පි. (පරි.). චීන තෙරුන්ගේ ගමන් විස්තරය හා හියුං සියුං භ්‍රමණවෘත්තාන්තය. ආනන්ද පොත්.

Encyclopedia of Britannica (1998). (knowledge in depth). Chicago University Press.

Karunaratne, T. (2006). History of printing and publishing in Ceylon *1736-1912*. Author

Paranavitana, S. (1970). Inscriptions of Ceylon. Vol, pt. I.